පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

# තෙවන වාර පරීක්ෂණය - 2023

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I,II

11 ශ්‍රේණිය

පැය තුනයි

අමතර කියවීම් කාලය
මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා
ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී
ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

*සැලකිය යුතුයි*

**සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

  මැදිරිගිරිය විවිධ සේවා සමුපකාර සමිතියේ නව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නව තාක්ෂණය උපයෝගී කරගනිමින් කෘෂිකාර්මික ගොවිපලක් පවත්වාගෙන යනු ලබයි. මෙහි දී ඔවුන් ආර්තාපල්, බී ළූණු ඇතුළුව එළවළු වර්ග කිහිපයක් නිෂ්පාදනය කර අලෙවි කිරීම සිදු කරයි. තම කෘෂි නිෂ්පාදන කටයුතු පහසු කරගැනීම සඳහා ඔවුන් නිතරම නව තාක්ෂණය උපයෝගී කර ගන්නා ලදී. උදාහරණයක් ලෙස කෘමිනාශක බෝග සඳහා ඉසීමට ඩ්‍රෝන තාක්ෂණය උපයෝගී කරගනිමින් ලංකාවේ කෘෂි කර්මාන්තයට නව මුහුණුවරක් එක් කරන ලදී. එමෙන්ම තම සමුපකාරයට නව සාමාජිකයින් බඳවා ගැනීම සඳහා විවිධ වැඩසටහන් පවත්වන ලදී.

01) ඉහත සිද්ධියේ සඳහන් සමුපකාර සමිතිය මඟින් මූලික අවධානය යොමුකර ඇති මිනිස් අවශ්‍යතාව කුමක් ද ?

(1) කෘෂිකර්මය (2) සෞඛ්‍යය (3) ආහාර (4) රසවින්දනය

02) මැදිරිගිරිය සමුපකාර සමිතියේ අභ්‍යන්තර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වන්නේ,

(1) සමුපකාර සමිතියේ සේවකයින් හා ගනුදෙනුකරුවන්
(2) සමිතියේ සභාපති හා අධ්‍යක්ෂක මණ්ඩලය
(3) සමිතියේ අධ්‍යක්ෂකවරු සහ සමුපකාර කොමසාරිස්
(4) සමිතියේ සේවකයින් සහ සමුපකාර කොමසාරිස්

03) මැදිරිගිරිය සමුපකාර සමිතිය,

(1) පෞද්ගලික අංශයේ ලාභ අපේක්ෂිත ව්‍යාපාරයකි.
(2) සාමාජික සුබසාධනය අරමුණු කරගත් ව්‍යාපාරයකි.
(3) නවීන තාක්ෂණය භාවිත කරමින් ලාභ ලැබීමට උත්සාහ කරන ව්‍යාපාරයකි.
(4) රාජ්‍ය අංශයට අයත් ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

04) රජය විසින් ආනයනික බී ළූණු වෙනුවෙන් අයකරන ආනයනික බදු වැඩි කිරීම මෙම සමිතියට,

(1) ශක්තියකි (2) අවස්ථාවකි (3) තර්ජනයකි (4) දුර්වලතාවයකි

05) මැදිරිගිරිය සමූපකාර සමිතියේ නිෂ්පාදන සාධකයක් වන ''ව්‍යවසායකත්වය'' සඳහා නිදසුනක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය

(2) කෘෂි රසායනික ඉසීමට ඩ්‍රෝන තාක්ෂණය භාවිතය

(3) සමිතිය සතු සාමාජික මුදල්

(4) කෘෂිකාර්මික උපාධිය සහිත සාමාන්‍යාධිකාරී

06) ව්‍යාපාරයක .................................... තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන අතර .................................... තම නිෂ්පාදිතවල මිල තීරණය කිරීම කෙරෙහි උනන්දුවක් දක්වති.

(1) අයිතිකරුවන්, සේවකයන්  (2) අයිතිකරුවන්, සැලසුම්කරුවන්

(3) කළමනාකරුවන්, තරඟකරුවන්  (4) අයිතිකරුවන්, තරඟකරුවන්

07) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමක් වන්නේ,

(1) ජාත්‍යන්තර වෙළඳ සම්බාධක පැනවීම.

(2) දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම.

(3) නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කර වීම.

(4) ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම.

08) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සංඛ්‍යාව පිළිබඳ සීමාවන් දක්වා ඇත්තේ,

(1) හවුල් ව්‍යාපාර ආඥා පනතේ ය.

(2) වංචා වැළැක්වීමේ ආඥා පනතේ ය.

(3) 2007 අංක 07 දරණ සමාගම් පනතේ ය.

(4) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනතේ ය.

09) බැංකු මගින් සපයනු ලබන සේවා කිහිපයක් පහත දැක්වේ. එම සේවා අතරෙන් ජංගම ගිණුම් හිමියෙකුට පමණක් ලබාගත හැකි සේවාවක් වනුයේ,

(1) ණයපත් ආශ්‍රිත සේවාවන්  (2) ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම.

(3) විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන්  (4) ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාම.

10) ණයක් දුන් තැනැත්තෙකුට දෙන ලද ණය ප්‍රමාණය දක්වා ණය ලබාගත් තැනැත්තාගේ ජීවිතය රක්ෂණය කිරීමට හැකියාව තිබේ. මින් ප්‍රකාශ වන රක්ෂණ මූලධර්මය වනුයේ,

(1) උපරිම විශ්වාසය  (2) ආදේශනය  (3) රක්ෂණ හිමිකම  (4) හානි පූර්ණය

11) සන්නිවේදන ක්‍රියාවලියක ''ප්‍රතිපෝෂණය'' සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණ වීමට ප්‍රතිපෝෂණය අවශ්‍යම නැත.

(2) පණිවිඩය යවන්නාගෙන් ලබන්නාට වාචික හෝ වාචික නොවන මාධ්‍යයකින් ලැබෙන ප්‍රතිචාරය ප්‍රතිපෝෂණයයි.

(3) පණිවිඩය යවන්නා පණිවිඩය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ප්‍රතිපෝෂණයයි.

(4) පණිවිඩය ලබන්නාගෙන් යවන්නාට වාචික හෝ වාචික නොවන මාධ්‍යයකින් ලැබෙන ප්‍රතිචාරය ප්‍රතිපෝෂණයයි.

12) පහත X තීරුවේ ප්‍රවාහනය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් ද Y තීරුවේ ප්‍රවාහන මූලිකාංගද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ඉලෙක්ට්‍රොනික් මෝටර් රථය හඳුන්වාදීම. | A - මාර්ගය |
| 2. කොළඹ, මහනුවර අධිවේගී මාර්ගය ඉදිකිරීම. | B - මාධ්‍යය |
| 3. කටුනායක ගුවන් තොටුපල සංවර්ධනය කිරීම. | C - බලය |
| 4. රුසියා, යුක්රේන යුද්ධය නිසා ලෝක වෙළඳපලේ බොරතෙල් මිල ඉහළ යාම | D - පර්යන්තය |

ඉහත X තීරුවේ සඳහන් සිදුවීම් Y තීරුවේ සඳහන් ප්‍රවාහන මූලිකාංග සමඟ පිළිවෙළින් ගලපන ලද පිළිතුර තෝරන්න.

(1) A,B,D,C (2) B,A,C,D (3) B,A,D,C (4) B,C,A,D

13) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගස්වන ඕනෑම ආකාරයක් වෙළඳපොලකි. වෙළඳපොල භෞතික ස්ථානයක වශයෙන් මෙන්ම අන්තර්ජාලය හරහා ද සම්බන්ධ වේ. එම තත්ත්වය හඳුන්වන්නේ,

(1) ඉලක්ක වෙළඳපොල ලෙසය. (2) වෙළඳපොල අවකාශය ලෙසය.
(3) වෙළඳපොල සමස්තය ලෙසය. (4) භාණ්ඩ වෙළඳපොල ලෙසය.

14) පො/තෝපාවැව මහ විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් 2024 වර්ෂයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සාර්ථකව පැවැත්වීම සඳහා කමිටු පිහිටුවා ඒවාට සාමාජිකයින් පත් කරන ලදී. මෙය අයත් වන්නේ කළමනාකරණ ක්‍රියාවලියේ කුමන කාර්යට ද ?

(1) සැලසුම්කරණය (2) සංවිධානකරණය (3) මෙහෙයවීම (4) පාලනය

15) රජයේ වාණිජ බැංකුවක් විසින් 2023 වර්ෂයේ 05 වසර සමත් සිසු දරුවන් වෙනුවෙන් ගිණුමේ ඇති ශේෂය සැලකිල්ලට ගනිමින් තෑගි ලබාදීමට තීරණය කර තිබේ.
අලෙවිකරණ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙහි භාවිතා කර ඇත්තේ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යද ?

(1) නිෂ්පාදිතය (2) මිල (3) ස්ථානය (4) ප්‍රවර්ධනය

16) පහත සඳහන් අයෝජන මාර්ග අතරෙන් අවදානම අඩුම ආයෝජන මාර්ගය කුමක්ද ?

(1) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම. (2) දේපල මිල දී ගැනීම.
(3) ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම. (4) සාමාන්‍ය කොටස් මිල දී ගැනීම.

17) පහත දැක්වෙන අරමුණු අතරින් ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,

(1) ලාභදායිත්වය මැනීම
(2) මූල්‍ය තත්ත්වය දැන ගැනීම
(3) ඇල්මැති පාර්ශවයන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම
(4) නෛතිකමය අවශ්‍යතා ඉටු කිරීම

18) ව්‍යාපාරයක වත්කමක් වැඩිවීම හා වගකීමක් වැඩිවීමට අදාළ ගනුදෙනුව වන්නේ,

(1) ණයගැතියෙකුගෙන් රු. 10000ක මුදලක් ලැබීම
(2) අයිතිකරු විසින් රු. 200000ක මුදලක් ව්‍යාපාරයට යෙදවීම
(3) ණයහිමියෙකුට රු. 25000ක් ගෙවීම
(4) රු. 300000ක බැංකු ණයක් ලබා ගැනීම

19) මංජලී මල්ෂානිගේ ව්‍යාපාරයේ 2024-01-01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

***වත්කම් = හිමිකම් + වගකීම්***

***600000 = 400000 + 200000***

ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 500000ක් වටිනා යන්ත්‍රයක් රු. 250000ක් ගෙවා ඉතිරිය ණය පදනමට ලබා ගන්නා ලදී. එම ගනුදෙනුවෙන් පසු ගිණුම්කරණ සමීකරණයේ අගයන් නිවැරදිව දැක්වෙනුයේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 1100000 | = | 150000 | + | 950000 |
| (2) | 850000 | = | 400000 | + | 450000 |
| (3) | 850000 | = | 650000 | + | 200000 |
| (4) | 1100000 | = | 400000 | + | 700000 |

20) නිමේෂ් රුක්ෂාන්ගේ ව්‍යාපාරයේ 2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොත්වලින් උපුටා ගත් තොරතුරු කීපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2023-01-01 දිනට ප්‍රාග්ධනය | රු. | 500000 |
| 2023 වර්ෂයේ විකුණුම් ආදායම් | රු. | 100000 |
| 2023 වර්ෂයේ ආයෝජන ආදායම් | රු. | 25000 |
| 2023 වර්ෂයට අදාළ වියදම් | රු. | 50000 |
| 2023 වර්ෂයේ මුළු ගැනිලි | රු. | 10000 |

2023.12.31 දිනට නිමේෂ් රුක්ෂාන්ගේ හිමිකම,

(1) රු. 565000කි. (2) 550000කි. (3) රු. 590000කි. (4) රු. 625000කි.

21) ගැනිලි ගිණුම හර කිරීමට හේතුව වන්නේ,

(1) වියදම් වැඩිවීම හර නිසාය (2) හිමිකම් අඩුවීම හර නිසාය

(3) වත්කම් වැඩිවීම හර නිසාය (4) වගකීම් අඩුවීම හර නිසාය

22) වැඩිවීම බැර අඩුවීම හර යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන ගිණුම් දෙකක් වන්නේ,

(1) විදුලි ගාස්තු ගිණුම හා ණය ගැති ගිණුම

(2) විකුණුම් ගිණුම හා ගැනුම් ගිණුම

(3) බැංකු ණය ගිණුම හා බැංකු ජංගම ගිණුම

(4) බැංකු ණය ගිණුම හා ණය හිමි ගිණුම

23) ජයමිණිගේ ව්‍යාපාරයට රු. 60000ක් වටිනා භාණ්ඩ තොගයක් චෙක්පතක් නිකුත්කර මිල දී ගැනීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) භාණ්ඩ තොග ගිණුම හර 60000
බැංකු ගිණුම බැර 60000

(2) භාණ්ඩ තොග ගිණුම හර 60000
මුදල් ගිණුම බැර 60000

(3) ගැණුම් ගිණුම හර 60000
බැංකු ගිණුම බැර 60000

(4) ගැණුම් ගිණුම හර 60000
මුදල් ගිණුම බැර 60000

24) ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන උදිත් නිමන්ත විසින් රු.1200000ක් වටිනා ගෘහ භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. මෙම ගණුදෙනුව සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලියවිල්ල හා මූලික සටහන් පොත වනුයේ,

(1) වවුචරය හා පොදු ජ'නලය (2) වවුචරය හා මුදල් පොත

(3) ඉන්වොයිසිය හා ගැණුම් ජ'නලය (4) ඉන්වොයිසිය හා විකුණුම් ජ'නලය

25) ඉමල්ෂා විසින් තම ව්‍යාපාරයේ අලෙවිකරන එළවළු 10kgක් තම නිවසේ උත්සවයක් සඳහා රැගෙන යාම සටහන් කරනුයේ,

(1) පොදු ජ'නලයේ ය. (2) විකුණුම් ජ'නලයේ ය.

(3) ගැණුම් ජ'නලයේ ය. (4) මුදල් පොතේ ය.

- **26 හා 27 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී පහත තොරතුරු සැලකිල්ලට ගන්න.**

තීක්ෂණ නිර්මාල්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් වියදම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.
සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 5000කි. 2024-01-01 දිනට අත ඉතිරි මුදල රු. 600කි. ජනවාරි මාසයේ සුළු මුදල් වව්චර් වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

| | | |
|---|---|---|
| තැපැල් වියදම් | රු. | 800 |
| ගමන් වියදම් | රු. | 1300 |
| සංග්‍රහ වියදම් | රු. | 1800 |
| ලිපිද්‍රව්‍ය වියදම් | රු. | 600 |

26) 2024-02-01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල

(1) රු. 4500කි. (2) රු. 4400කි. (3) රු. 600කි. (4) රු. 5000කි.

27) සුළු මුදල් පොතේ ලිපි ද්‍රව්‍ය වියදම් තීරුවේ එකතුව ගිණුම්ගත කිරීමේ නිවැරදි ද්විත්ව සටහන දැක්වෙන්නේ,

(1) ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුම හර 600
මුදල් පොත බැර 600

(2) මුදල් පොත හර 600
ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුම බැර 600

(3) සුළු මුදල් පොත හර 600
ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුම බැර 600

(4) ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුම හර 600
සුළු මුදල් පොත බැර 600

28) වෙනුර අනුහස්ගේ ව්‍යාපාරය 2024-01-20 දින සිදු කල ණයට විකුණුම් සඳහා රු. 15000 චෙක්පතක් ණයගැති නිමෝන් දිනෙත්ගෙන් ලැබී එදිනම බැංකුගත කළ හ. දින කිහිපයකට පසු වාණිජ බැංකුව විසින් එම චෙක්පත අගරු කළ බව නිවේදනය කරන ලදී. චෙක්පත අගරු වීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(1) ණයගැති ගිණුම (හර)
මුදල් ගිණුම (බැර)

(2) ණයගැති ගිණුම (හර)
බැංකු ගිණුම (බැර)

(3) මුදල් ගිණුම (හර)
ණයගැති ගිණුම (බැර)

(4) බැංකු ගිණුම (හර)
ණයගැති ගිණුම (බැර)

29) ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ දී ලෙජර් ගිණුම්වල හර ශේෂ සහ බැර ශේෂ වෙන වෙනම තීරු දෙකක ඇතුළත් කර පිළියෙල කරන ලැයිස්තුව හැඳින්වනුයේ,

(1) ලාභ හෝ අලාභ ප්‍රකාශනය යනුවෙනි

(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යනුවෙනි

(3) ශේෂ පිරික්සුම යනුවෙනි

(4) ආදායම් ප්‍රකාශය යනුවෙනි

30) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියේ දී සිදු වූ වරදක් නිවැරදි කිරීමකට අදාළව තබන ලද සටහනකි.

| | | | |
|---|---|---|---|
| ණය හිමි ගිණුම හර | | 12000 | |
| | අවිනිශ්චිත ගිණුම බැර | | 12000 |

ව්‍යාපාරයේ ගිණුම් තැබීමේ දී සිදු වී ඇති වරද වනුයේ,

(1) රු. 12000ක් ණය හිමියන්ට ගෙවීම ගිණුම්ගත නොවීම ය.

(2) රු. 12000ක් ණය හිමියන්ට ගෙවීම ණයහිමි ගිණුමට පමණක් සටහන් කර තිබීම ය.

(3) රු. 12000ක් ණය හිමියන්ට ගෙවීම ණයහිමි ගිණුමට හර නොවීම ය.

(4) රු. 12000ක් ණය හිමියන්ට ගෙවීම ණය හිමියාට දෙවරක් සටහන් කර තිබීම ය.

31) රන් තරු ක්‍රීඩා සමාජයේ 2023 වර්ෂයේ සාමාජික සංඛ්‍යාව 120කි. වාර්ෂික සාමාජික මුදල රු. 300කි. සාමාජිකයන් 20 දෙනෙකු වර්ෂය අවසාන දිනට සාමාජික මුදල් ගෙවා නැත. 2023 වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශයේ සහ ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් විය යුතු වටිනාකම් පිළිවෙලින්

(1) රු. 36000 හා රු. 30000කි (2) රු. 30000 හා රු. 36000කි

(3) රු. 30000 හා රු. 6000කි (4) රු. 6000 හා රු. 36000කි

32) ක්‍රීඩා සමාජයකට අදාළ ගිණුම් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - හිඟ සාමාජික මුදල් B - ක්‍රීඩා පිටිය බදු දීම

C - ටිකට්පත් විකිණීම D - ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම

ආදායම් ප්‍රකාශනයේ සටහන් කරන අයිතම වන්නේ,

(1) A හා D පමණි (2) A හා C පමණි

(3) B හා D පමණි (4) B හා C පමණි

33) භාණ්ඩ ඒකකයක විකුණුම් මිල ගණනය කිරීම නිවැරදිව දැක්වෙන්නේ,

(1) විකුණුම් මිල = ඒකකයක ප්‍රාථමික පිරිවැය + ලාභාන්තිකය

(2) විකුණුම් මිල = ඒකකයක නිෂ්පාදන පිරිවැය + ලාභාන්තිකය

(3) විකුණුම් මිල = ඒකකයක පොදු කාර්යය පිරිවැය + ලාභාන්තිකය

(4) විකුණුම් මිල = මුළු නිෂ්පාදන පිරිවැය + ලාභාන්තිකය

34) ඇඟලුම් නිෂ්පාදන ආයතනයක මෝස්තර නිර්මාණ ශිල්පියාට ගෙවූ මුදල,

(1) සෘජු ශ්‍රම පිරිවැයකි. (2) වෙනත් සෘජු පිරිවැයකි.

(3) වක්‍ර ශ්‍රම පිරිවැයකි. (4) වෙනත් වක්‍ර පිරිවැයකි.

- **පහත තොරතුරු ඇසුරෙන් අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ටෂිනිගේ ව්‍යාපාරයේ 2023-12-31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ප්‍රාග්ධනය | 260000 |
| විකුණුම් | 250000 |
| ගැණුම් | 120000 |
| ලී බඩු හා උපකරණවල පිරිවැය | 300000 |
| 10% ස්ථාවර තැන්පතුව | 100000 |
| ප්‍රචාරණය | 50000 |
| 2023-01-01 ලී බඩු හා උපකරණ ක්ෂය වෙන් කිරීම | 80000 |
| වැටුප් හා වේතන | 10000 |
| විදුලි ගාස්තු | 15000 |
| ලද වට්ටම් | 6000 |
| දුරකථන ගාස්තු | 1000 |

**අතිරේක තොරතුරු**

1) ලී බඩු හා උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරේ

2) 10% ස්ථාවර තැන්පතු සිදු කර ඇත්තේ 2023-01-01 දිනය

3) 2023-12-31 දිනට තොගය රු. 15000කි.

35) 2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වන්නේ,

(1) රු. 105000කි (2) රු. 300000කි (3) රු. 120000කි (4) රු. 250000කි

36) වර්ෂයට අදාළ ව්‍යාපාරයේ වෙනත් ආදායම්වල එකතුව වන්නේ,

(1) රු. 17000කි (2) රු. 10000කි (3) රු. 15000කි (4) රු. 16000කි

37) මෙම ව්‍යාපාරයේ දැක්වෙන පරිපාලන වියදමක් සහ බෙදාහැරීමේ වියදමක් පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) වැටුප් හා වේතන, විදුලි ගාස්තු (2) ප්‍රචාරණය, ලද වට්ටම්

(3) ප්‍රචාරණය, දුරකථන ගාස්තු (4) වැටුප් හා වේතන, ප්‍රචාරණය

38) 2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

(1) රු. 55000කි (2) රු. 106000කි (3) රු. 30000කි (4) රු. 161000කි

39) 2023-12-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ පෙන්විය යුතු ජංගම නොවන වත්කම්වල අවසාන වටිනාකම වන්නේ

(1) රු. 290000කි (2) රු. 390000කි (3) රු. 400000කි (4) රු. 190000කි

40) 2023-12-31 අවසානයේ දී ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම වන්නේ,

(1) රු. 405000කි (2) රු. 315000කි (3) රු. 259000කි (4) රු. 314000කි

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

*සැලකිය යුතුයි*

**පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද,** II කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද** බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01) ව්‍යාපාර කළමනාකරණ උපාධිධාරියෙකු වූ අරුණ ප්‍රභාත් මහතා උපාධිය අවසන් වර්ෂයේ ලිහිසි තෙල් (Lubricants) සහ මෝටර් රථ අමතර කොටස් ආනයනය කරන ආයතනයක සේවය කරන ලදී. වර්ෂ 03ක සේවා කාලයෙන් පසුව තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. පසුව තමා ඉතිරි කරගත් රු.500,000 ක මුදල යොදා ''ප්‍රභාත් මෝටර්ස්'' නමින් ව්‍යාපාරයක් තම නගරය වූ ගල්නෑව නගරයේ 2024/01/01 දින ආරම්භ කරන ලදී. පසුව රු.300,000 ක බැංකු ණයක් එදිනම ලබාගෙන ව්‍යාපාරය පුළුල් කර එහි කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා ආයතනයට කළමනාකරුවෙකු සහ සේවකයන් 03 දෙනෙකු බඳවා ගන්නා ලදී. 2024 වර්ෂයේ තම ව්‍යාපාරය තව දුරටත් පුළුල් කිරීමට සැලසුම් කල ද ඉන්ධන වියදම් වැඩි වීම, විනිමය අනුපාතය ස්ථාවර නොවීම වැනි ප්‍රශ්න හේතුවෙන් එය 2024 වර්ෂය තුල සිදු නොකිරීමට තීරණය කරන ලදී.

2024/01/31 දිනෙන් අවසන් මාසය තුල සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 01/02 | ගොඩනැගිලි කුලී ගෙවීම් | 15,000 |
| 01/04 | අමු ද්‍රව්‍ය මිලට ගැනුම් | 250,000 |
| 01/05 | ගෙවූ රක්ෂණ ගාස්තු | 7,000 |
| 01/10 | ලිපි ද්‍රව්‍ය මිලට ගත්තා | 8,000 |
| 01/12 | අත්පිට මුදලට විකුණුම් | 120,000 |
| 01/17 | ණයට විකුණුම් | 30,000 |
| 01/20 | විදුලි ගාස්තු | 5,000 |
| 01/22 | අත්පිට මුදලට විකුණුම් | 180,000 |
| 01/25 | වැටුප් ගෙවීම | 40,000 |

***අමතර තොරතුරු***

- ජනවාරි මාසයේ දුරකථන ගාස්තුව රු. 6,000 කි. එය 2024/01/31 දින වන විටත් ගෙවා නැත.
- බැංකු ණය පොලිය වාර්ෂිකව 8% වුවත් ජනවාරි මාසයට අදාල පොලිය මාසය අවසන් වන විටත් ගෙවා නැත. ජනවාරි මස අවසන් වන විට ව්‍යාපාරයේ තොග සියල්ල අවසන්ව ඇත.

(i) (අ) ''ප්‍රභාත් මෝටර්ස්'' ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද ?

(ආ) හිමිකාරීත්වය යටතේ ''ප්‍රභාත් මෝටර්ස්'' අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(ii) මෙම ව්‍යාපාරයේ දක්නට ලැබෙන නිෂ්පාදන සාධක 02 ක් නම් කර ඒ සඳහා උදාහරණ 02ක් දක්වන්න.

(iii) මෙම ව්‍යාපාරයට මුහුණ දීමට සිදු වන තර්ජන දෙකක් නම් කරන්න.

(iv) (අ) මෙම ව්‍යාපාරයට ඇති ශක්තීන් 02ක් දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයට ගෙවීමට සිදුවන ප්‍රධාන බදු වර්ගයක් නම් කරන්න.

(v) (අ) ව්‍යාපාරය ආරම්භ කල දිනට අදාල ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

(ආ) බැංකු ණය ලබා ගැනීමට අදාල ද්විත්ව සටහන වට්නාකම් සහිතව ලියා දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරය තුල දක්නට ලැබෙන ජංගම වත්කම් වලට අයත්වන උදාහරණ දෙකක් දක්වන්න.

(vii) මෙම ව්‍යාපාරයට භාවිතා කිරීමට සිදුවන මූලික සටහන් පොත් අතුරින් මුදල් පොත හැරුණු විට භාවිතා කරන මූලික සටහන් පොතක් හා ඊට අදාල මූලාශ්‍ර ලේඛනය නම් කරන්න.

(viii) 2024/01/31 දිනට ''ප්‍රභාත් මෝටර්ස්'' ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2024/01/31 දිනෙන් අවසන් මාසය සඳහා ''ප්‍රභාත් මෝටර්ස්'' ව්‍යාපාරයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(x) ''ප්‍රභාත් මෝටර්ස්'' ව්‍යාපාරයේ,

(අ) 2024/01/31 දිනට ඇති ජංගම වගකීමක් නම් කරන්න.

(ආ) 2024/01/31 දිනට හිමිකම කොපමණද ? **(ලකුණු 02x10 = 20 යි)**

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**
**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)**

02)

(i) (අ) ව්‍යාපාර යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරයක් විසින් ලඟාකර ගැනීමට බලාපොරොත්තු වන උප අරමුණු හෙවත් ඉලක්කයන් 02 ක් නම් කරන්න. **(ලකුණු 02යි)**

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) රටක ආර්ථික දියුණුව සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ රජයයි.

(ආ) ඉන්ධන මිල වැඩි වීම ව්‍යාපාරවලට දුර්වලතා ඇති කරයි.

(ඉ) ඉන්දියාවේ මුදල් ඒකකය වන්නේ ඉන්දියානු ඩොලර්ය.

(ඊ) වර්තමානයේ අප රටේ භාණ්ඩ හා සේවා මත අය කරන VAT ප්‍රතිශතය 15% කි.

**(ලකුණු 02යි)**

(iii) ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව වර්ග කිරීමේ දී භාවිතා කරන ප්‍රමාණාත්මක නිර්ණායක හතරක් දක්වන්න. **(ලකුණු 02යි)**

(iv) (අ) ඒක පුද්ගල ව්‍යාපාරයක දක්නට ලැබෙන අවාසි 02ක් දක්වන්න.

(ආ) හවුල් ව්‍යාපාරයක දක්නට ලැබෙන වාසි 02ක් දක්වන්න. **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 08 යි)**

03)

(i) (අ) සමූපකාර සමිතිවල දක්නට ලැබෙන ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

(ආ) රාජ්‍ය සංස්ථාවල දක්නට ලැබෙන වාසි 02ක් සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

(ii) පහත දැක්වෙන ප්‍රකාශවල සත්‍ය අසත්‍යතාව දක්වන්න.

(අ) ජනතාවට අත්‍යවශ්‍ය වන සේවා සැපයීම බොහෝ විට දෙපාර්තමේන්තු මඟින් සිදුවේ.

(ආ) ස්ථාවර සුළු පරිමාණ වෙළඳසැල් වලට උදාහරණයක් ලෙස සුපිරි වෙළඳසැල් දැක්විය හැක.

(ඉ) සිල්ලර වෙළෙන්දා පරිභෝගිකයා සමඟ සෘජුව සම්බන්ධ වේ.

(ඊ) ස්ථාවර තැන්පතු හා සම්බන්ධ කොන්දේසි බැංකුවේ අභිමතය පරිදි වෙනස් කළ හැක.

**(ලකුණු 02යි)**

(iii) රජයේ සංකල්පයක් අනුව නුවරඑළියේ සිට කොළඹට දුම්රියෙන් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

(අ) වෙනත් මාධ්‍යයකට වඩා දුම්රියෙන් එළවළු ප්‍රවාහනය කිරීමේ වාසි 02ක් ලියන්න.

(ආ) දුම්රිය ප්‍රවාහනයට සාපේක්ෂව ගුවන් ප්‍රවාහනයේ වාසි 02ක් දක්වන්න. **(ලකුණු 02යි)**

(iv) ව්‍යාපාරික කටයුතු සඳහා සන්නිවේදනයේ ඇති වැදගත්කම කරුණු 02ක් ඇසුරින් දක්වන්න.

**(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 08 යි)**

04)

(i) කළමනාකරණය නිර්වචනය කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. **(ලකුණු 02යි)**

(අ) සැලසුම් කරන ලද ආකාරයට ම ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේද යන්න සොයා බැලීම මෙහෙයවීම නම් වේ.

(ආ) රජයට අවශ්‍ය අරමුදල් ලබාගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා සාමාන්‍ය කොටස් නිකුත් කරනු ලබයි.

(ඉ) ලෝකයේ දියුණු රටවල මිනිස් වුවමනාවන් තෘප්තිමත් කිරීම සඳහා ඇති සම්පත් අසීමිත වේ.

(ඊ) නිෂ්පාදිතයක් පාරිභෝගිකයාට බෙදා හැරීමත් සමග අලෙවිකරණ ක්‍රියාවලිය අවසන් වේ. **(ලකුණු 02යි)**

(iii) සාලිය තම නිවස අසල පිහිටා තිබෙන පාසල ඉදිරිපිට ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් පවත්වාගෙන යනු ලැබේ. මෙහි පොත් 06 මිලදී ගන්නේ නම් එක පොතක් නොමිලේ ලබාදෙයි.

(අ) මෙම ව්‍යාපාරයේ ඉලක්ක වෙළෙඳපල කුමක් ද ?

(ආ) පොත් 06ක් මිලදී ගැනීමේ දී එක් පොතක් නොමිලේ ලබාදීම අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත් වේද ? **(ලකුණු 02යි)**

(iv) සමාගමක සාමාන්‍ය කොටස් මිලදී ගැනීමේ ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

**(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය
## (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

05.

(i) වත්කමක හා වගකීමක දැකිය හැකි සමාන ලක්ෂණයක් දක්වන්න. **(ලකුණු 02යි)**

(ii) ව්‍යාපාරයක ලෙජරයේ දැකිය හැකි හිමිකම් ගිණුම් දෙකක් ලියන්න. **(ලකුණු 02යි)**

(iii) සහස්නිගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසය තුළ සිදු වූ ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපෑ අන්දම පහත දැක්වේ.

| දිනය | තොගය | +උපකරණ+ | ණයගැතියෝ+ | මුදල් = | ප්‍රාග්ධනය | + ණයහිමියෝ |
|---|---|---|---|---|---|---|
| 1/1ශේෂය | 50000 | + 30000 | +10000 | +10000= | ? | +30000 |
| 1/2 | | | | +30000= | +30000 | |
| 1/8 | -10000 | | +15000 | = | +5000 | |
| 1/20 | +7000 | | | -7000= | | |
| 1/22 | -2000 | | | = | -2000 | |
| 1/26 | | | | -10000= | -10000 | |
| 1/29 | | | | -10000= | | -10000 |

**අවශ්‍ය වන්නේ**

(අ) එක් එක් දිනයේ සිදු වී ඇති ගණුදෙනුව වටිනාකම් සහිතව ලියන්න. **(ලකුණු 03යි)**

(ආ) 2023-01-31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න. **(ලකුණු 01යි)**

(iv) ප්‍රමුදිගේ ව්‍යාපාරයේ 2024 ජනවාරි මාසයේ සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| *දිනය* | *ඉන්වොයිස් අංකය* | *ගැණුම්කරු* | *වටිනාකම (රු)* |
|---|---|---|---|
| 2024-01-04 | 101 | චමුදිනි | 12000 |
| 2024-01-18 | 102 | තුෂානි | 18000 |
| 2014-01-24 | 103 | ආකර්ෂණී | 11000 |

**අවශ්‍ය වන්නේ,**

(අ) ජනවාරි මාසයට අදාළ විකුණුම් ජ'නලය පිළියෙල කිරීම

(ආ) අදාළ ලෙජර් ගිණුම් පිළියෙල කිරීම **(ලකුණු 04යි)**

**(මුළු ලකුණු 12 යි)**

06.

(i) (අ) ව්‍යාපාරයක පොදු ජ'නලය තුළ සටහන් කරන ගණුදෙනු 02ක් සඳහන් කරන්න.

(ආ) නිෂ්පාදිතයක මිල තීරණය කිරීමේ ප්‍රධාන සාධක 02ක් නම් කරන්න. **(ලකුණු 02යි)**

(ii) පහත දැක්වෙන්නේ පියුමාලි නවෝද්‍යාගේ ව්‍යාපාරයේ 2023-12-31 දිනට ලෙජර් ගිණුම්වල පැවති ශේෂයන් ය.

| | | | |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 1000000 | ස්ථාවර තැන්පතු | රු. 150000 |
| විකුණුම් | රු. 400000 | ණයගැතියෝ | රු. 30000 |
| ලද වට්ටම් | රු. 8000 | බැංකු ණය | රු. 30000 |

**අවශ්‍ය වන්නේ,**

මෙම ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පිළියෙල කර ප්‍රාග්ධනය සෙවීම. **(ලකුණු 02යි)**

(iii) ජයන්ත ලී බඩු නිෂ්පාදකයෝ 2023 දෙසැම්බර් මස අල්මාරි 10ක් නිෂ්පාදනය කර අලෙවි කරන ලදී. නිෂ්පාදනයට අදාළ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| වඩු කාර්මික වැටුප | රු. 100000 | ලෑලි සඳහා | රු. 150000 |
| ඇණ සහ පොලිෂ් | රු. 20000 | මුරකරු වැටුප | රු. 25000 |
| යන්ත්‍ර ක්ෂය | රු. 20000 | සෘජු වෙනත් වියදම් | රු. 40000 |
| විදුලිය | රු. 30000 | වෙනත් පොදු කාර්ය වියදම් | රු. 8000 |

20%ක ලාභාන්තිකයක් තබා අල්මාරි සියල්ල විකුණා ඇත.

**අවශ්‍ය වන්නේ,**

(අ) මුළු නිෂ්පාදන පිරිවැය (ආ) ඒකකයක පිරිවැය

(ඇ) මුළු ලාභය **(ලකුණු 04යි)**

(iv) අංජලී නවෝද්‍යාගේ ව්‍යාපාරයේ 2023 නොවැම්බර් මාසය සඳහා පිළියෙල කළ බැංකු ගිණුමේ ශේෂය රු. 52000ක් වූ අතර බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය ඊට වෙනස් විය. පසුව පහත හේතු සොයා ගන්නා ලදී.

1) ණයගැති සෘජු ප්‍රේෂණ රු. 20000කි
2) බැංකුව අය කල බැංකු ගාස්තු රු. 3000කි
3) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 18000කි.
4) මාසය තුළ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 10000කි.

**අවශ්‍ය වන්නේ,**

අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

ආ) 2023 නොවැම්බර් 30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය **(ලකුණු 04යි)**

**(මුළු ලකුණු 12 යි)**

07.

(i) (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක අන්තර්ගත වන මූලිකාංග දෙකක් ලියන්න

(ආ) ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. **(ලකුණු 02යි)**

(ii) දෙව්මිණි ක්‍රීඩා සමාජයේ 2023 වර්ෂයේ සිටි සාමාජික සංඛ්‍යාව 200ක් වන අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1000කි. 2023 වර්ෂය සඳහා පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

**ලැබීම් හා ගෙවීම් ගිණුම**

| | | | |
|---|---|---|---|
| 1/1 ශේෂය | 20000 | ක්‍රීඩා පිටිය නඩත්තු වියදම් | 30000 |
| සාමාජික මුදල් | 180000 | ක්‍රීඩා උපදේශක ගාස්තු | 60000 |
| | | ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | 70000 |
| | | 12/31 ශේෂය ප/ගෙ | 40000 |
| | 200000 | | 200000 |

**අවශ්‍ය වන්නේ,**

2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෙව්මිණි ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශය

**(ලකුණු 02යි)**

(iii) ජලනිගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2023-12-31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ

| | *හර (රු)* | *බැර (රු)* |
|---|---|---|
| මුදල් ශේෂය | 60000 | |
| තොගය (2023-01-01 දිනට) | 40000 | |
| බොල් ණය | 2000 | |
| ණයගැතියෝ | 20000 | |
| ණය හිමියෝ | | 30000 |
| බෙදාහැරීමේ රථ පිරිවැයට | 250000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2023-01-01 දිනට) | | 30000 |
| 15% බැංකු ණය | | 100000 |
| විකුණුම් | | 250000 |
| ගැණුම් | 150000 | |
| රක්ෂණ ගාස්තු | 13000 | |
| බැංකු ණය පොලිය | 10000 | |
| විදුලි ගාස්තු | 4000 | |
| දුන් වට්ටම් | 2000 | |
| ලද වට්ටම් | | 4000 |
| වැටුප් හා වේතන | 25000 | |
| බෙදාහැරීමේ රථ නඩත්තු වියදම් | 18000 | |
| ප්‍රාග්ධනය | | 180000 |

**අතිරේක තොරතුරු**

- 2023-12-31 දිනට තොගය රු. 40000කි
- 2023-12-31 දිනට උපචිත රක්ෂණ ගාස්තු 2000කි
- බෙදාහැරීමේ රථ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කෙරේ.

**අවශ්‍ය වන්නේ,**

(අ) ජලනිගේ ව්‍යාපාරයේ 2023-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය **(ලකුණු 04යි)**

(ආ) 2023-12-31 දිනට ජලනිගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 04යි)**

**(මුළු ලකුණු 12 යි)**